කමල් වික්‍රමනායක
2021 දෙසැම්බර් 05

ගරු පොලිස්පති තුමනි,

<u>ගලගොඩඅත්තේ ඥානසාර නම් දේශපාලන චීවරධාරියා විසින් තපෝවනයේ රතන හිමිට අසභ්‍ය වචනයෙන් බැණ හිංසා කරන බවට තර්ජනය කිරීම</u>

2021 වසරේ නොවැම්බර් මස 22 දින පමණ රත්නපුරයේ මිණිපුර අමාශාන්ති තපෝවන වාසී තපෝවනයේ රතන හිමි විසින් භික්ෂූන් වහන්සේලා දේශපාලනය නොකළ යුතු බවට අන්තර්ජාලය හරහා විකාශය කෙරුණු දේශණයකදී සඳහන් කරන ලදී. එම දේශණය පිළිබඳ කුපිත වූ ගලගොඩඅත්තේ ඥානසාර නම් දේශපාලන චීවරධාරියා එම දිනයේදී හෝ ඊට ආසන්න දිනයකදී තපෝවනයේ රතන හිමිට අසභ්‍ය වචනයෙන් බැණ, අල්ලා පොළොවේ ගසන බව පවසමින් සහ අදාළ දේශණය අන්තර්ජාලයෙන් ඉවත් කරන ලෙස බලපෑම් කරමින් දුරකථනයෙන් තර්ජනය කර ඇත.

තර්ජනයට පසුව තපෝවනයේ රතන හිමි විසින් නිකුත් කර ඇති වීඩියෝවක් සහ තර්ජනයට හේතු කාරණා වූ වීඩියෝව පහත සබැඳියෙන් බැලිය හැක:

["භික්ෂූන්ට දේශපාලනය අකැප බව පැවසීම නිසා ගලගොඩඅත්තේ ඥානසාර තපෝවනයේ රතන හිමිට තර්ජනය කිරීමෙන් පවිති ඇවතට පැමිණීම"
https://www.adhikarana.org/case/2021-12-05/21](https://www.adhikarana.org/case/2021-12-05/21)

මවිසින් නොදන්නා යම් අයෙකු විසින් මා වෙත එවන ලද සංස්කරණය කර ඇත්දැයි මා නොදන්නා ගලගොඩඅත්තේ ඥානසාර නම් දේශපාලන චීවරධාරියාගේ තර්ජනය කිරීම අඩංගු හඬ පටය මෙම සබැඳිය හරහා ලබා ගත හැක:

["ගලගොඩඅත්තේ ඥානසාර දේශපාලන චීවරධාරියා තපෝවනයේ රතන හිමිට කුණුහරුපයෙන් බැණ තර්ජනය කිරීම දැක්වෙන හඬ පටය"
https://www.adhikarana.org/download/20211205-tha8teef](https://www.adhikarana.org/download/20211205-tha8teef)

එම තර්ජනය කිරීම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් ආරක්ෂා කර ඇති මූලික අයිතිවාසිකම්වල දැක්වෙන සිතීමේ නිදහස, හෘදය සාක්ෂියේ නිදහස සහ ආගමික නිදහස; වධ හිංසාවලින් නිදහස; සර්ව සාධාරණත්වයේ අයිතිවාසිකම්; භාෂණයේ නිදහස සහ ප්‍රකාශනය ඇතුළු අදහස් පළ කිරීමේ නිදහස යන මූලික අයිතිවාසිකම් උල්ලංඝණය කිරීමක් සේ පෙනේ.

තපෝවනයේ රතන හිමිගේ ආරක්ෂාව තහවුරු කිරීමට කටයුතු කරන මෙන් ඉල්ලමි. තව ද මේ පිළිබඳ විමර්ශණය කර ගලගොඩඅත්තේ ඥානසාර නම් දේශපාලන චීවරධාරියාව හික්මවීම පිණිස සුදුසු ක්‍රියාවක් කරන මෙන් ඉල්ලමි.

බුද්ධශාසනයේ සහ සමාජයේ යහපැවැත්ම ගැන සිතා මවිසින් මෙම පැමිණිල්ල යොමු කරණු ලබන්නේ තපෝවනයේ රතන හිමිගේ අනුදැනුමක් නොමැතිවයි.

තෙරුවන් සරණයි!

කමල් වික්‍රමනායක